## කාමාවචර සිත්

## අකුසල සිත් 12/ ලෝබ සහගත සිත් 8

1. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුක්ත අසංඛාරික සිත
2. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුක්ත සසංඛාරික සිත
3. සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුක්ත අසංඛාරික සිත
4. සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුක්ත සසංඛාරික සිත
5. උපේක්ඛා සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිත
6. උපේක්ඛා සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත සසංඛාරික සිත
7. උපේක්ඛා සහගත දිට්ඨිගත විප්පයුක්ත අසංඛාරික සිත
8. උපේක්ඛා සහගත දිට්ඨිගත විප්පයුක්ත සසංඛාරික සිත

## අකුසල සිත්

අකුසල සිත් බෙදා දක්වන්නේ ඒවායේ යෙදී ඇති මූල (හේතු) අනුවයි. අකුසල මූලයෝ 3 කි. එනම් ලෝබ ද්වේෂ මෝහ ලෙසිනි.

ලෝබ සහ ද්වේෂ කිසිවිටකත් එකම සිතක නොයෙදෙයි. ලෝබය යෙදී ඇති සිත් ලෝබ මූලික සිත් ලෙස දක්වති. ඒවා සියල්ල 8කි. ලෝබය ඇතිවන්නේ මෝහය හේතුකොට ගෙන නිසාවෙන් මෙම සිත්වල මොහයද ඇතුලත් වේ. ද්වේෂය සහිත සිත් ද්වේෂ මූලික සිත් ලෙසද හඳුන්වන අතර එහිද මෝහය ඇතුලත්ය. නමුත් මොහ මූලික සිත්වල ලොබය හෝ ද්වේෂය ඇති නොවේ.

## අකුසල සිත් 12/ ලෝබ සහගත සිත් 8

මේවා සිත් 8 ට බෙදා ඇති අතර එසේ බෙදා දක්වන්නේ මූලික කරුනු තුනකට අනුවයි **1.වේදනාව 2. දිට්ඨිය (මිථ්‍යා දිට්ඨි) 3. අසංඛාරික සසංඛාරික** බව.

වේදනාව - * මෙහි වේදනාව ලෙස දක්වන්නේ කයේ ඇතිවන්නක් නොව සිතේ ඇතිවන විඳීම් ස්වභාවයකි.

- සිතේ ඇතිවන වේදනාව ආකාර තුනකි . එනම් -1. **සෝමනස්ස 2. දෝමනස්ස 3. උපේක්ඛා**

නාවිමන ආරණ්‍ය සේනාසනය
මාකුර, අඹේපුස්ස, 035-3350651
https://navimanafm.wixsite.com/navimana